## රේගු නිවේදනයයි

## ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 01/2025

## 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

## ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, රේගු ආඥාපනත (235 වැනි අධිකාරය වන) යටතේ 2023 මාර්තු මස 24 දිනැති අංක 2324/49 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති, රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ පවතින ඇමුණුම II හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) යටතේ වූ අයිතම අංක 33 මගින් දැක්වෙන, පහත සඳහන් නියමය 2025 ජනවාරි මස 28 වැනි දින සිට, ඉවත්කරනු ලබන බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙමෙ ආඥාව මගින් නියම කරමි.

**රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ පවතින ඇමුණුම II හි රේගු බද්දෙන් නිදහස් භාණ්ඩ ලැයිස්තුව (ආනයන) යටතේ වූ අයිතම අංක 33;**

"87 පරිච්ඡේදය යටතේ දැක්වෙන, 1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්ද අදාළ වන්නාවූ ආනයනය කරන ලද මෝටර් වාහන, එන්ජින් සවිකළ චැසි, බඳ (බොඩි) කැබ්ස් ඇතුළුව ; "

අනුර කුමාර දිසානායක

**අනුර කුමාර දිසානායක**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන**
**අමාත්‍ය**

2025 ජනවාරි මස 27 වැනි දින
කොළඹ 01.
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.